# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය

## 04 වන පාඩම ; කර්මය හා පුනර්භවය

### [[ 2024/2025 ]] 03 වන ප්‍රශ්නය

I තුන්දොරින් කරන ක්‍රියාවක් කර්මයක් බවට පත්වීමට අවශ්‍ය චෛතසිකය නම් කරන්න.

II කර්මය විපාක දෙන ආකාර දෙකක් හඳුන්වන්න.

III අ) චුති චිත්ත සහ පටිසන්ධි චිත්ත හඳුන්වන්න.

ආ) කර්මය මැනවින් පැහැදිලි කිරීම සඳහා ප්‍රතීත්‍ය සමුප්පාදය උපයෝගී කොටගෙන ඇති ආකාරය විස්තර කරන්න.

IV " කර්මය පිළිබඳව බෞද්ධ ඉගැන්වීම,සියල්ල කර්මයට භාර නොදේ." සාධක තුනක් ඇසුරෙන් සනාථ කරන්න.

### [[ 2020/2021/2022/2023 ]] 04 වන ප්‍රශ්නය

I සචේතනික ක්‍රියා හා අචේතනික ක්‍රියා යන පදවල අර්ථය දක්වන්න.

II අ) ඉහත 1හි දැක්වූ ක්‍රියා අතුරින් කර්මය බවට පත් වන්නේ කවරක්දැයි ලියන්න.

ආ) ඉහත 1හි දැක්වූ ක්‍රියාවල බෙදීම් දෙක නම් කරන්න.

III අ) විපාක දෙන කාලය අනුව කර්මය සතර වැදෑරුම් වේ. ඒවා නම් කරන්න.

ආ) ඉහත තුනෙහි (අ) හි දැක්වූ ප්‍රභේද වලින්දෙකක් හඳුන්වන්න.

IV අ) ත්‍රි විද්‍යා අතුරින් පුනර්භයක් ඇතැයි සනාථ වන ඤාණ දෙකක් නම් කරන්න.

ආ) කර්මය හා පුනර්භය අතර අති සම්බන්ධතාව පෙළි කරන්න.

### [[ 2019/2020 ]] 04 වන ප්‍රශ්නය

I භාරතීය ආගම් හා දර්ශන පිළිගෙන ඇති ආකාරයට කර්මය හා විපාකය කවරේදැයි සඳහන් කරන්න.

II අ) කුසල හා අකුසල යන වචනද්වයෙහි වෙනස පහදන්න.

ආ) කුසල,අකුසල සිදු කිරීමට ප්‍රධානත්වය ගන්නා ද්වාරත්‍රය නම් කරන්න.

III අ) කුසල හා අකුසල මූල දක්වන්න.

ආ) ඒවායින් අකුසල මූල කෙටියෙන් හඳුන්වන්න.

IV අකුසල වාචී ක්‍රියා හේතුවෙන් පුද්ගලයා හා සමාජය පරිහානියට පත්වන ආකාරය පෙන්වා දෙන්න.

## [[ 2018/2019 ]] 04 වන ප්‍රශ්නය

I බුදු දහම 'කර්මය' යනුවෙන් හඳුන්වන චෛතසිකයේ නම හා එම චෛතසිකය මුල් කරගෙන කායී සිදු කරන ද්වාරත්‍රය නම් කරන්න.

II සචේතනික හා අචේතනික ක්‍රියා කවරේ දැයි උදාහරණ මඟින් පෙන්වා දෙන්න.

III ද්වාරත්‍රය මුල් කරගෙන කරන ක්‍රියා කවරේ දැයි දක්වා, ඒවා කවර නම් මිනුම් දඬු මුල් කරගෙන හිතකර අහිතකර ලෙසින් තෝර ඇත්දැයි දක්වන්න.

IV විපාක දෙන කාල අනුව කර්මයේ ප්‍රභේද දක්වා,කෙළෙස් නැසූ උතුමන්ට පවා යහපත් අයහපත් කර්ම විපාකවලට මුහුණ දීමට සිදුවූ ආකාරය නිදසුන් මඟින් ගෙනහැර දක්වන්න.

## [[ 2016/2017 ]] 04 වන ප්‍රශ්නය

I කුසල-අකුසල කර්ම රැස්කරන ප්‍රධාන දොරටු තුන නම් කරන්න.

II එම දොරටු තුනට ඇතුළත්වන පරිදි දස අකුසල කර්ම පථ බෙදා දක්වන්න.

III එම අකුසල කර්ම පථ සිදු කිරීමේදී මූලිකත්වය ගන්නා චෛතසිකය නම් කර, අකුසල මූලයන් වෙන් වෙන් වශයෙන් හඳුන්වන්න.

IV හොඳ-නරක,යහපත-අයහපත මනාව තේරුම් ගැනීමෙන් සුරක්ෂිත ජීවිතයක් ගත කිරීම සඳහා බෞද්ධ කර්ම සංකල්පයෙන් ලැබෙන අනුබලය පැහැදිලි කරන්න.

## [[ 2015/2016 ]] 04 වන ප්‍රශ්නය

I සචේතනිකව කයින්,වචනයෙන්,මනසින් කරන දේ සඳහා දී ඇති පාලි වචන දක්වන්න.

II එම දොරටු වලට අදාළව දොරටු දෙකකින් සිදු කරන කුසල කර්ම දෙක බැඟින් හතරක් ලියන්න.

III කර්ම නියාමය හැර අනෙක් නියාම ධර්ම දක්වා එමඟින් ප්‍රකටවන බෞද්ධ ඉගැන්වීම් පහදා දෙන්න.

IV තුන් දොරටුව සංවර කර ගැනීමෙන් සිදුවන යහපත පුද්ගල සංවර්ධනය සඳහා හේතුවන අයුරු විස්තර කරන්න.

## [[ 2014/2015 ]] 02 වන ප්‍රශ්නය

I කර්මයට අදාළ විපාක ලැබෙන අවශ්ථා හතර නම් කරන්න.
II ඒවායින් දෙකක් හඳුන්වන්න.
III බුදු දහමට අනුව කර්මය යනු කුමක්දැයි පහදා, කර්මක්ෂය කළ උතුමෝ කවරහුදැයි පෙන්වා දෙන්න.
IV යහපත්-අයහපත් කර්ම බීජ රැස් කිරීම නිසා ජීවිතයක් සරු හෝ නිසරු වන අයුරු පහදා දෙන්න.

## [[ 2013/2014 ]] 03 වන ප්‍රශ්නය

I බුදු දහමට අනුව කර්මය සක්‍රීය කරවන චෛතසිකය නම් කරන්න.
II එම චෛතසිකය මඟින් සියළු ක්‍රියා හොඳ නරක වශයෙන් බෙදෙන පදනම දක්වන්න.
III එකී පදනම මත තුන් දොරින් සිදු කරන ක්‍රියා බෙදා පෙන්වන්න.
IV නරක ක්‍රියාවන්ගෙන් ඈත්ව හොඳ ක්‍රියාවන්හී යෙදීමෙන් පුද්ගල ජීවිතය සරු කරගත හැකි අයුරු පහදා දෙන්න.

## [[ 2012/2013 ]] 01 වන ප්‍රශ්නය

I විපාක දෙන කාල අනුව කර්මය සතර වැදැරුම් වේ. ඒ සතර නම් කරන්න.
II ඒවා කෙටියෙන් හඳුන්වන්න.
III වචී කර්ම ගනයට අයත් ක්‍රියා නම් කර ඒවායේ ස්වාභාවය පහදා දෙන්න.
IV සමාජයේ අන්‍යෝන්‍ය සමඟිය හා විශ්වාසය බිඳ වැටීමට මෙම වචී අකුසල කර්ම හේතුවන අයුරු පැහැදිලි කරන්න.

## [[ 2011/2012 ]] 04 වන ප්‍රශ්නය

I බුදු දහමෙහි චේතනා චෛතසිකයට මුල්වූ ප්‍රධාන ඉගැන්වීම කවරේදැයි නම් කරන්න.
II එම චේතනා චෛතසිකය ක්‍රියාත්මක වීමේදී පුද්ගලයා විසින් කරනු ලබන ක්‍රියාදාම දෙක දක්වා, ඒවා කෙටියෙන් හඳුන්වන්න.
III සංචේතනිකව හා අසංචේතනිකව සිදුවන ක්‍රියාදාමවල වෙනස පහදා,ඉන් අසංචේතනික ක්‍රියාවනගේ දක්නට ලැබෙන විශේෂතා පැහැදිලි කරන්න.
IV සදාචාර සම්පන්න ජන සමාජයක් ගොඩනැංවීම උදෙසා යහපත් සංචේතනික ක්‍රියාවන්ගේ ඇති වැදගත්කම පහදන්න.

## [[ 2010/2011 ]] 03 වන ප්‍රශ්නය

I මිනිසා කුසල් අකුසල් සිදු කරගන්නා ද්වාරත්‍රය නම් කරන්න.

II එම ද්වාරත්‍රයෙන් සිදු කෙරෙන වැරදි සංඛ්‍යාව දක්වා, එක් ද්වාරයකට අයත් වැරදි නම් වශයෙන් පෙන්වා දෙන්න.

III මනුෂ්‍යාකුගේ මව් කුස පිළිසිඳ ගැනීම සඳහා සම්පූර්ණ විය යුතු කරුණු තුන කවරේදැයි දක්වා, ඒවායින් කවර නම් කරුණක් මව් කුසට සම්බන්ධ නොවූවහොත් එකී පහළ වීම නොවන්නේදැයි පෙන්වා දෙන්න.

IV ද්වාරත්‍රයෙන් සිදු කෙරෙන වැරදි වළක්වා ගැනීමෙන් සදාචාර සම්පන්න පුද්ගල ජීවිතයක් ගොඩනගා ගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

## [[ 2009/2010 ]] 04 වන ප්‍රශ්නය

I විපාක දෙන කාල අනුව කර්මය කී වැදෑරුම්ද?ඒවා නම් කරන්න.

II ඒවායින් දෙකක් හඳුන්වා දෙන්න.

III කර්මය හා පුනර්භවය අතර ඇති සම්බන්ධතාව කවරේදැයි පැහැදිලි කරන්න.

IV යහපත් හෝ අයහපත් උපතක් ලැබීමට එම සම්බන්ධතාව උපයෝගී වන ආකාරය පහදන්න.

## [[ 2008/2009 ]] 01 වන ප්‍රශ්නය

I සචේතනික ක්‍රියා-අචේතනික ක්‍රියා යන පදවල අර්ථය ලියන්න.

II මේවායින් කර්මය බවට පත්වන්නේ කවරක් දැයි ලියා එහි ප්‍රධාන බෙදීම් දෙක නම් කර්න්න.

III විපාක දෙන කාල අනුව කර්මය හතර වැදෑරුමා.ඒ හතර නම් කර කෙටියෙන් හඳුන්වන්න.

IV ත්‍රිවිද්‍යාවෙන් අතරෙන් පුනර්භවයක් ඇතැයි සනාථ වන ඥාණ දෙක දක්වා,කර්මය හා පුනර්භවය අතර සබඳතාව පෙන්වා දෙන්න.

## [[ 2007/2008 ]] 04 වන පාඩම

I අකුසල වාචී කර්ම නම් කරන්න.

II ඒවා කෙටියෙන් හඳුන්වන්න.

III කුසල හා අකුසල යන වචන දෙකෙහි වෙනස දක්වා අකුසල මූල නම් කර,ඒවායෙන් එකක් කෙටියෙන් හඳුන්වන්න.

IV පුද්ගලයා හා සමාජ පරිහානියට එම අකුසල වචී කර්ම හේතුවන අයුරු පහදා දෙන්න.

## [[ 2006/2007 ]] 01 වන ප්‍රශ්නය

I බුදු දහම කර්මය යනුවෙන් හඳුන්වන චෛතසිකය නම් කර්න්න.
II එම චෛතසිකය ප්‍රධනව කරන ක්‍රියා ගැන සඳහන් වන පාලි පාඨය ලියන්න.
III පුද්ගලයා හා සමාජ කේන්ද්‍ර කොටගෙන හොඳ- නරක තීරණය කර ගැනීමට එම චෛතසිකය මිනුම් දණ්ඩක් වන අයුරු දක්වන්න.
IV සදාචාර සම්පන්න ජීවිතයක් ගත කිරීමට බෞද්ධ කර්ම සංකල්පය උපයෝගී කරගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

## [[[[[2004]]]]] 01 වෙනි ප්‍රශ්නය

I අකුසල මනෝ කර්ම නම් කරන්න.
II ඒවායින් දෙකක් හඳුන්වා දෙන්න.
III එම අකුසල කර්ම ,මනෝ කර්ම ගණයට ඇතුළත් කිරීමේ වැදගත්කම පහදන්න.
IV අකුසල කර්ම වලින් වැළකීම පුද්ගල හා සමාජ පාරිශුද්ධියට හේතුවන අයුරු පැහැදිලි කරන්න.

## [[[[[2003]]]]] 03 වන ප්‍රශ්නය

I අවිද්‍යාව නිසා රැස්කරන සංස්කාර නම් කරන්න.
II බුදුදහම කර්මය ලෙස සළකන්නේ කවරක් දැයි ලියා ඒ හා සම්බන්ධ ප්‍රකට දේශනා පාලි පාඨය ලියන්න.
III "සියළු සංස්කාර නැසූ උතුමන් පවා අතීත කුසලාකුසල කර්මයන්හී විපාක ලබයි." නිදසුන් මඟින් එම කාරණා දෙක පහදන්න.
IV පුනර්භවයට කර්මය හේතුවන ආකාරය පැහැදිලි කරන්න.

## [[[[[2002]]]]] 04 වන ප්‍රශ්නය

I චුති සිත හඳුන්වන්න.
II පුනර්භවය හා කර්මය අතර සම්බන්ධය පහදන්න.
III බුදු දහමේ කර්මය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පෙන්වා දෙන්න.
IV කුසල චේතනා හා අකුසල චේතනා යන දෙවර්ගයෙහි වෙනස දක්වන්න.

## [[[[[2001]]]]] 02 වන ප්‍රශ්නය

I අකුසල මූල නම් කරන්න.
II ඒවායින් එකක් විස්තර කරන්න.
III කර්මය හා සිත අතර ඇති සම්බන්ධතාව පහදන්න.
IV කර්මය ක්ෂය කරන අයුරු පහදන්න.

## [[[[[2000]]]]] 02 වන ප්‍රශ්නය

I කර්මය පිළිබඳව බුදුරදුන්ගේ නිර්වචනය දක්වන්න.
II කුසල මූල හා කුසල හඳුන්වන්න.
III පංච නියාම ධර්ම හඳුන්වන්න.
IV සියල්ල සිදුවන්නේ කර්මය නිසා දැයි පරීක්ෂා කරන්න.

## [[[[[1999]]]]] 03 වන ප්‍රශ්නය

I විපාක දෙන පිළිවෙළ අනුව කර්මයන් ප්‍රභේද කොට ඇති අන්දම නම් කරන්න.
II උපපජ්ජවේදනීය හා අපරාපරියවේදනීය කර්ම අතර ඇති වෙනස උදාහරණ එක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.
III පුනර්භවයට කර්මය හේතුකාරක වන අන්දම සැකෙවින් දක්වන්න.
IV "සියල්ල සිදුවන්නේ කර්මය නිසාම නොවේ." කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම ඇසුරෙන් අදහස් දක්වන්න.

## [[[[[1998]]]]] 03 වන ප්‍රශ්නය

I කර්මය මූලික වශයෙන් ප්‍රභේද කොට දැක්වෙන සතර ආකාරය නම් කරන්න.
II විපාක දෙන කාල වශයෙන් කර්මයේ ප්‍රභේද නම් කරන්න.,
III පංචානන්තර්ය කර්මයන්ගෙන් හතරක් නම් කොට, ආනන්තර්ය කර්ම විපාක දීමේදී සෙසු කර්මයන්ගෙන් වෙනස්වන ආකාරය පහදන්න.
IV " බෞද්ධ කර්ම ධර්මය අනුව අසංචේතනික ක්‍රියා 'කර්ම' වශයෙන් නොගැනේ." මේ අදහස පැහැදිලි කරන්න.

## [[[[[1997]]]]] 04 වන ප්‍රශ්නය

දොරටු තුනෙන් සිදු කෙරෙන අකුසල කර්ම නම් කොට කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමේදී චේතනාව වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.